


# මෙම සමාගමේ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල/ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොල රත්මලාන පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්මික ශිල්පී (ජලනල )11 වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** පානිය ජල පොම්ප සහ නල පද්ධති, රසායන ද්‍රව්‍ය සැපයුම් පොම්ප පද්ධති, ගිනි නිවීමේ ජල පොම්ප සහ නල පද්ධති. වැසිකිළි උපකරණ සහ පද්ධති, වාය සමන ජලනල පද්ධති සහ උපකරණ, අපජලය සහ මළ පරිවහන පද්ධති සහ පල්දෝරු පවිත්‍රාගාර පද්ධති වල පෙර ලැයිස්තු ගත සේවා පූර්ව නඩත්තු කටයුතු අධීක්ෂණ නිළධාරීන්ගේ උපදෙස් හා අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යාම හා විශේෂිත තත්ත්වයන් පිළිබඳව නිළධාරීන් දැනුවත් කිරීම.

**රැකියාවේ වගකීම් :**

I ඉහත පද්ධති වල හදිසි බිඳ වැටීම් සඳහා ක්ෂණිකව සහභාගී වී නිවැරදි කිරීම් කල යුතු අතර, ඒ සම්බන්ධ අදාළ අංශ සමග මනා සන්නිවේදනයකින් හා සහයෝගයෙන් කටයුතු කිරීම.

II බිඳ වැටුණු පදධති හැකි ඉක්මනින් නිවැරදි කිරීම සඳහා අවශ්‍ය උපකරණ හා අනෙකුත් ද්‍රව්‍ය හඳුනාගෙන ලැයිස්තුගත කිරීම.

III ඉහත සඳහන් පද්ධති සහ ඒවායේ සවිකර ඇති තත්ත්වයන් පාලන උපකරණ, ජල පොම්ප, වායු ගැන්වීමේ උපකරණ ආදිය නිසි අවධානයකින් , අධීක්ෂණයකින් හා නිසි නඩත්තුවකින්, මනා ක්‍රියාකාරීත්වයෙන් පවත්වා ගෙන යාම.

IV ඉහත පද්ධති වල පෙර ලැයිස්තු ගත පරීක්ෂා කිරීම් කල යුතු අතර, අදාළ වාර්තා නිසි ලෙසට පවත්වාගෙන යාම.

V GI/PE/HDPF/PVC/DI නල සහ උපකරණ වල නඩත්තු කටයුතු කිරීම.

VI අවශ්‍ය අවස්ථාවන්වලදී ඉහත සඳහන් පද්ධති ස්ථාපනය කිරීම සහ නවීකරණය කිරීම් සඳහා සහභාගී වීම.

VII අනෙකුත් ජලනල කාර්මිකයින්ගේ කටයුතු සඳහාද අවශ්‍ය අවස්ථාවන් වලදී සහාය දැක්විය යුතු අතර අධීක්ෂණ නිළධාරීන් විසින් කලින් කලට පවරනු ලබන අනෙකුත් සේවා කටයුතු සඳහාද සහභාගී වීම.

VIII තම සේවා කටයුතු වලට අදාළ දෛනික වාර්තා සටහන් පොත් නිසි පරිදි පවත්වා ගෙන යාම.

IX හදිසි ආපදාකාරී අවස්ථාවන්වලදී ගුවන් තොටුපොල නඩත්තු කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගි වීම.

X ඉහත පද්ධති පූර්ව පරීක්ෂා කර පූර්ව දෝෂ හඳුනා ගැනීම හා වාර්ථා කිරීම.

**සුදුසුකම් :**

(අ) කාර්මික විද්‍යාලයක් මගින් හෝ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (T.V.E.C) විසින් පිළිගනු ලබන ආයතනයක් මගින් හෝ පවත්වනු ලබන පූර්ණ කාලීන එක් (01) අවුරුදු පුහුණු පාඨමාලාවක් ජලනල ක්ෂේත්‍රයෙන් සාර්ථකව හදාරා තිබිය යුතුය.

**හෝ**

(ආ) ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටම (NVQ Level 4) වෘත්තීය සහතියක් ජලනල ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**සහ**

(ඇ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :-**

ඉහත තනතුරු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍යතාවය අනුව සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් පහත සඳහන් ලිපිනයට 2024 **ජුනි මස 03 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (ජලනල) II වන ශ්‍රේණිය** යන තනතුර සඳහන් කළ යුතුවේ.

තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

පාඨමාලා සහතික හා සේවා සහතික සහ අදාළ සහතිකවල ඡායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Date :22/05/2024